පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 488

සෞඛ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 488

ආයතනයේ නම - සෞඛ්‍ය අමාත්‍යාංශය

අනු අංකය	සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණ	- ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.)/ ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් - කාරක සභාවේ නිරීක්ෂණ / නිර්දේශ -	නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග
01	අනු කාරක සභාව විසින් යෝජිත නිර්දේශ සලකා බැලීම යටතේ විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procurement system)2024 මාර්තු 31 දිනට පෙර අවසන් කිරීමට කටයුතු කිරීම.	මේ සම්බන්ධයෙන් සාකච්ඡා වාර කිහිපයක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සිදුකර ඔවුන්ට අවශ්‍ය දත්ත ලබාදුන් නමුත් මෙහි වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය පාර්ශවයෙන් සැහීමකට පත්විය නොහැකි බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලදි. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ යම් කොටසක් 2024.03.31 දින වනවිට අවසන් කිරීමටත්, 2024.12.31 දින වනවිට පද්ධතියේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කළ බවත්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදි. නමුත් ලෝක බැංකු ආධාර මත අදාළ සමාගම සමඟ පැවති එකඟතාවය සමාලෝචනය කර නව එකඟතාවයක් අත්සන් කිරීමට සිදු වූ බවත් 2024.08.31 වනවිට මෙම කාරක සභාව ලබාදුන් නිර්දේශයට අදාළ ජාතික තරඟකාරී ලංසු කැඳවීම් (National Competitive Bidding) හා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම් (International Competitive Bidding) ප්‍රසම්පාදන	මේ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් අදාළ කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ඇත. තවද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 08/2019 හා 08/2019 (i) දරන චක්‍රලේඛවල සඳහන් උපදෙස් ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා රෝහල්/ ආයතන විසින් වාර්ෂික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් පළ කිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කිරීම සහ වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ සම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම ආදී කටයුතු e-GP පද්ධතිය හරහා සිදු කිරීමට කටයුතු කර ඇත. එසේම e-GP පද්ධතිය හරහා වෙළඳපළ මිල සැඳහුම් ක්‍රමය යටතේ වන ප්‍රසම්පාදන සිදු කිරීම අනිවාර්ය බවට වන නියෝග මුදල් අමාත්‍යාංශ/ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් නිකුත් කොට නොමැත.

		කොටස සකස් කර අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. <u>නිරීක්ෂණ/නිර්දේශ</u> විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය පාර්ශවයෙන් සකස් කරන තුරු, විගණන අංශය මගින් යෝජනා කරන ලද පියවරයන් අනුගමනය කිරීමට කටයුතු කරන ලෙසට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි. විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procurement system) සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර එහි පියවරයන්, අවසන් කිරීමට බලාපොරොත්තු වන නිශ්චිත දිනවකවානු ඇතුළත් වාර්තාවක් 2024 අප්‍රේල් 02 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. /ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.	තව ද , e-GP පද්ධතිය හරහා වෙළඳපළ මිල සැදහුම් ක්‍රමය යටතේ වූ ප්‍රසම්පාදන පමණක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශය ලබා දී ඇති අතර මහා භාණ්ඩාගාරය විසින් e-GP පද්ධතිය සංවර්ධනය කළ පසු අනෙකුත් ප්‍රසම්පාදන ක්‍රමද e-GP පද්ධතිය හරහා ක්‍රියාත්මක කළහැකිය.
02	ස්වස්ථ මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීම	සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවතින ස්වස්ථ මෘදුකාංග පද්ධතිය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමුවිය. මෙහිදී පෙර පැවති පද්ධතිය මගින් සියලු රෝහල් සම්බන්ධ සංඛ්‍යා දත්ත ලබාගත නොහැකි වූ බවත් නව ස්වස්ථ පද්ධතිය මගින් එම තොරතුරු ලබා ගත හැකි බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලද අතර 2024 වර්ෂයේ ඖෂධ ඇස්තමේන්තු	ස්වස්ථ පද්ධතිය 2023 ජුනි 01 වන දින ස්ථාපිත කර ක්‍රියාත්මක කර ඇත. ක්‍රියාත්මක කිරීමෙන් පසුව, අවසාන පරිශීලකයින් විසින් බොහෝ පැමිණිලි ඉදිරිපත් කරන ලදි. පසුව හඳුනා ගන්නා ලද්දේ පද්ධතියට නිසි පරිශීලක අවශ්‍යතා පිරිවිතර (URS), පද්ධති අවශ්‍යතා පිරිවිතර (SRS) සහ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂාව (UAT) නොමැති බවයි.

		සකස් කරන ලද්දේ මෙම ක්‍රමවේදය හරහා බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. දිවයින පුරා පිහිටි රෝහල් වල තිබෙන ඖෂධ ප්‍රමාණයන්, ඒවායේ තොග අවසන් වන කාල සීමාව ආදී කරුණු පද්ධතිය හරහා පරීක්ෂා කරන ආකාරය පැහැදිලි කරන ලදි. යළි තොග ඇණවුම් මවිටම සම්බන්ධයෙන් රට පුරා පිහිටි රෝහල් සියල්ලෙන්ම තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් කාරක සභාව විමසා සිටි අතර එහිදී රෝහල් 1161 ක් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 361ක් දැනටමත් ස්වස්ථ පද්ධතියට සම්බන්ධ කර තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එමෙන්ම මානව සම්පත හා වෛද්‍ය උපකරණ සම්බන්ධ තොරතුරු ද මෙම පද්ධතියට එක්කළ හැකි බව මෙහිදී අදහස් දක්වමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කළේය.	ඒ අනුව මෙම ගැටළු COPA කමිටුව විසින් හඳුනාගෙන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය තොරතුරු ඒකකයට භාර දෙන ලදී. COPA කමිටුවේ නියෝගය සහ සෞඛ්‍ය තොරතුරු ඒකකයේ උපදෙස් යටතේ, වෛද්‍ය සැපයුම් අංශයේ ICT ඒකකය අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර පද්ධති මොඩියුල 23 සඳහාම SRS නැවත පරීක්ෂා කළේය. සංශෝධිත SRS ලේඛන සකස් කර නිසිලෙස අත්සන් කරන ලදී. පසුව, එම කොටස්කරුවන් සමඟම UAT සැසි 19 පවත්වන ලද අතර, ප්‍රධාන ක්‍රියාකාරී මොඩියුල සාර්ථකව නිම කිරීමෙන් පසු, 2.0 අනුවාදය Version සැසි 19 ක් ස්වස්ථා පද්ධතිය තුළ යොදවන ලදී. ගිවිසුමේ නියමයන්ට අනුව, ලංසුකරු විසින් සම්පූර්ණ කරන ලද මෘදුකාංගය ආරක්ෂක ඇගයීම සඳහා SLCERT වෙත ඉදිරිපත් කළ යුතුය. පද්ධති සංවර්ධන සමාගම විසින් මූලාශ්‍ර කේතය (Source Code) සමාලෝචනය සඳහා SLCERT වෙත ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් සපයන ලද සමාන පරිසරයක් (Clone Environment) භාවිතයෙන් (Requirement Non-functional) පරීක්ෂා කිරීම කළ යුතුව ඇත. කෙසේ වෙතත්, අදාළ පහසුකම සැපයීමට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මේ වන තෙක් ප්‍රතිචාර නොදැක්වූ බැවින් මෙය සිදු කිරීමට තව දුරටත් ඉතිරිව ඇත. කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඉතිරි 30% ගෙවීම් පද්ධති සංවර්ධක ලූන්ස් ලැබ් (පුද්ගලික) සමාගමට ගෙවිය යුතුය.

03	ඖෂධ ඇණවුම්වල දෘඩ පිටපත් ලැබෙන තුරු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ නොකිරීම	පෙර පැවති මෘදුකාංග පද්ධතිය හරහා ඖෂධ ඇණවුම් කිරීමේ දී අදාළ අනෙකුත් ලේඛන පෙන්නුම් කිරීමක් සිදු නොවුන බැවින් දෘඩ ලේඛන ලැබෙන තුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට නොහැකි බව මෙහිදී අදහස් දක්වමින් ජාතික ඖෂධ නීතිගත සංස්ථාවේ සභාපතිවරයා විසින් ප්‍රකාශ කරන ලදි.	ඇණවුම්වල දෘඩ පිටපත රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව වෙත ලැබුණු පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබේ.
04	ස්වස්ථ පද්ධතිය සායන හා රෝගියා දක්වාම ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම	රෝගියා දක්වාම ඖෂධ නිකුත් කිරීම පිළිබඳ දත්ත ස්වස්ථ පද්ධතිය ඇතුළත් කිරීම, ඖෂධ තොග කළමනාකරණය සඳහා අවශ්‍ය නොවන බව මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එහිදී එම ක්‍රියාවලිය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වෙනුවෙන් වාර්ෂිකව වැය කිරීමට අපේක්ෂිත පිරිවැය අති විශාල බවත්, එය ශ්‍රී ලංකාව වැනි රාජ්‍යයකට දැරීමට සිදුවන විශාල වියදමක් බවත් හෙතම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.	ස්වස්ථ පද්ධතිය 2023 ජුනි 01 වන දින ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලදි. 2024 අප්‍රේල් 26 දිනැතිව නිකුත් කරන ලද අංක 01-16/2024 දරන වක්‍රලේඛයට අනුව, පද්ධති විෂය පථය වෛද්‍ය සැපයුම් කළමනාකරණයට සීමා විය. කෙසේ වෙතත් ජීවිත කාලීන විද්‍යුත් සෞඛ්‍ය වාර්තාව (Lifelong Electronic Health Records) ස්ථාපිත කිරීමට කටයුතු සිදු කරමින් පවතී.
05	රෝගී වාර්තා සහ සායන කටයුතු සඳහා ස්වස්ථ මෘදුකාංග පද්ධතිය පුළුල් කිරීම	ගෝලීය අරමුදල මඟින් මේ සඳහා වෙනම ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම සඳහා එකඟතාවයකට පැමිණ තිබෙව බවත් අපේක්ෂිත අරමුදල් ලැබුණු පසු රෝහල් 30 ක විද්‍යුත් රෝගී වාර්තා තබාගැනීමේ ක්‍රමවේදයක් (Electric Patient Record System) 2025 ජුනි මාසය වනවිට සකස් කර අවසන් කිරීමට අපේක්ෂා කරන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. ඉහත සඳහන් රෝහල් 30ට අමතරව දැනට රටපුරා පිහිටි රෝහල් 90ක පමණ විද්‍යුත් නොරතුරු පද්ධති ක්‍රියාත්මක වන බවත් එම පද්ධති සියල්ල ඡාලගතව ක්‍රියාත්මක කිරීම සඳහා ගෝලීය අරමුදල් ආධාර මඟින්	ස්වස්ථ පද්ධතිය 2023 ජුනි 01 වන දින ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලදි. 2024 අප්‍රේල් 26 දිනැතිව නිකුත් කරන ලද අංක 01-16/2024 දරන වක්‍රලේඛයට අනුව, පද්ධති විෂය පථය වෛද්‍ය සැපයුම් කළමනාකරණයට සීමා විය. තවද මේ සඳහා අවශ්‍ය දෘඩාංග (Hardware) ලබාගෙන ඇත. මෘදුකාංග සංවර්ධනය (Software Development) ලංසු කැඳවා ඇත.

		සමෝධානිත ක්‍රමවේදයක් ද සැකසීමට ආධාර ලබාදෙන බැවින් රටේ ප්‍රධාන රෝහල් සියල්ල ආවරණය වන පරිදි විදුහුත් රෝගී වාර්තා තබාගැනීමේ ක්‍රමවේදය පිහිටුවීමට හැකිවන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.	
06	අසාධු ලේඛනගත කළ වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම්/ ආයතන නැවත වෛද්‍ය සැපයුම් සිදු කිරීම වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම	සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි අසාධු ලේඛනගත කර තිබෙන සැපයුම්කරුවන් සම්බන්ධ තොරතුරු අමාත්‍යාංශය මඟින් ලිඛිතව ඉල්ලා තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් ප්‍රකාශ කරන ලද අතර සැපයුම්කරුවන් අසාධු ලේඛනගත කිරීමට අදාළව නිර්ණායක සකස් කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ හා මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පැවැත් වූ නමුත් මෙම අසාධු ලේඛනගත කිරීම් පිළිබඳව දැනට නිශ්චිත මාර්ගෝපදේශ සකස් වී නොමැති බවත් එකී මාර්ගෝපදේශ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් සෑහෙස් කර ඉදිරිපත් කිරීමට නියමිත බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. <u>නිරීක්ෂණ / නිර්දේශ</u> තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම්/ආයතන අසාධු ලේඛනගත කළ ද වෙනත් නම්වලින් පෙනී සිටීමින් නැවත වෛද්‍ය සැපයුම් සිදු කිරීම වැළැක්වීම සඳහා පියවර ගතයුතු බවත් විදුහුත් ප්‍රසම්පාදන පද්ධතිය පිළිබඳව සාකච්ඡාවේ දී තත්ත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම්/	මේ සම්බන්ධයෙන් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ. • මෙම සැපයුම්කරුවන් සම්බන්ධයෙන් වන සම්පූර්ණ ලේඛනයක් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සතුවන අතර එය එම සංස්ථාවේ නිල වෙබ් අඩවියේ ද ප්‍රදර්ශනය කර ඇත. • අසාධුලේඛන ගතකර ඇති සමාගම් විවෘත ප්‍රසම්පාදනයන් සඳහා ලංසු ඉදිරිපත් කර ඇති අවස්ථාවලදී ඒවා ලංසු ඇගයීමේ මුල් අවස්ථාවේම ප්‍රතික්ෂේප කරනු ලැබේ. • තවද සැපයුම්කරුවන් ලංසු කැඳවා (LICB, LNCB) අදාළ තෝරා ගැනීම් කරන අවස්ථාවේදී ඔවුන් අසාධුගත ලේඛනගත වී ඇති බව නිරීක්ෂණය වුවහොත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචිය ඇති පෙර සැපයුම්කරුවන් වුවද ඔවුන්ව නොසලකා හරිනු ලබයි. • අසාධුගත සැපයුම්කරුවන්ගේ ලේඛනයක් ආයතනය තුළ පවත්වාගෙන යනු ලබන අතර, සැපයුම්කරුවන් අසාධුගත කිරීමට අදාළව ප්‍රතිපත්තියක් ආයතනය තුළ ස්ථාපිත කොට 2026.02.26 දින සිට ක්‍රියාත්මක කරනු ලබයි.

		ආයතන අසාධු ලේඛනගත කිරීමේ ක්‍රමවේදය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙතින් ලබා ගන්නා ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.	තවද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මගින් ඉදිරියේදී හඳුන්වාදීමට නියමිත ඖෂධ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන නව මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් වීයි විධාන ප්‍රකාරව මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට ද පියවර ගනු ලැබේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ හා ප්‍රසම්පාදන අත්පොත මෙන්ම ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මගින් ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත ඖෂධ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන නව මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ද කොන්ත්‍රාත් පැහැරහැර ඇති කොන්ත්‍රාත්කරුවන් අසාධු ලේඛන ගත කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගනු ඇත.
07	<u>අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නැවැත්ත ස්ථාපනය කිරීම</u>	මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය තුළ රැස්වීම් වාර කිහිපයක් පැවැත් වූ බව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ ද මෙහි පෙනිනි කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවත් සති කිහිපයක් තුළ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. සඳහන් කළේය. <u>නිරීක්ෂණ / නිර්දේශ</u> සුදුසු සාකච්ඡාවක් සිදුකර සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නැවත ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව වෙත 2024 මැයි 17 දිනට පෙර දැනුම්දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.	සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය අමාත්‍යාංශය දැනට ඒකාබද්ධ කටයුතු සිදු කරනු ලැබේ. මීට පෙර අවස්ථාවකදී ද සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ස්වාධීන ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබාදී තිබුණ ද එය ඉතා කෙටි කාලයක් ඇතුළත (වසර දෙකක් ඇතුළත) අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් නැවත ඒකාබද්ධ කර ඇත. තවද යෝජිත පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඒකක දෙකක් ලෙස ක්‍රියා කිරීමේදී රටෙහි පවතින වර්තමාන ආර්ථික තත්ත්වය හමුවේ වියදම් කළමනාකරණයේ දී අපහසුතා ඇති වන බව ද නිරීක්ෂණය කරමි. ඒ අනුව දැනට පවත්නා පරිදි සෞඛ්‍ය අමාත්‍යාංශය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඒකාබද්ධ සංවිධාන ව්‍යුහයක් ලෙසම පවත්වා ගැනීම සුදුසු බවට නිර්දේශ වී ඇත.

08	ප්‍රසම්පාදන ක්‍රියාවලින් සඳහා දීර්ඝ කාලයක් ගතවීම වැළැක්වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ වෙනම ප්‍රසම්පාදන අංශයක් ඇති කිරීම හා ප්‍රමාදයට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම	විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procurement system) ක්‍රියාත්මක කිරීම තුළින වෛද්‍ය සැපයුම් ප්‍රමාදයන් අවම කර ගැනීමේ හැකියාවක් ඇති බව මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළ අතර කාරක සභාව පෙන්වා දුන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කරන බව ගෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව විසින් දැනට සංස්ථාවේ නිලධාරීන්ගේ භාවිතය සඳහා ප්‍රසම්පාදන අත්පොතක් පිළියෙල කර තිබෙන බවත් එක් එක් ප්‍රසම්පාදන පියවරයන්ට ගතවන කාලය නිශ්චය කොට දක්වා තිබෙන බවත්, ඒ සඳහා වගකිවයුතු නිලධාරීන් ද එහි සඳහන් කර තිබෙන බවත් ඉදිරියේ දී එය කාරක සභාව වෙත ලැබීමට සලස්වන බවත් රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.	රාජ්‍ය මූල්‍ය පිළිබඳ කාරක සභාවේ උපදෙස් පරිදි ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන රෝහල් බොහොමයක් විසින් අධීක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන් පත් කිරීමට කටයුතු කර ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන රෝහල් සමඟ සම්බන්ධීකරණය වෙමින් මේ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට කටයුතු කරනු ඇත. තවද ප්‍රසම්පාදන කළමනාකරණ අංශයේ නිලධාරීන්ද අදාළ ආයතන රෝහල් සමඟ සෘජුව සම්බන්ධීකරණය වෙමින් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් විමසා බැලීමට ද කටයුතු කරනු ලැබේ. එසේම ප්‍රසම්පාදන කළමණාකරණ අංශයේ පාලනයෙන් බැහැර කාරණා වලදී ප්‍රමාදයන් සිදු විය හැකි වුවත්, ඒ සෑම අවස්ථාවකදීම අදාළ මැදිහත්වීම් සිදුකරමින් ප්‍රසම්පාදන කාර්යයන් නියමිත කාලයට අවසන් කිරීමට රෝහල්/ආයතන /අංශ වෙත අවශ්‍ය උපදෙස් සහ සහය ලබාදීමට ද කටයුතු කරනු ලැබේ.
09	<u>දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු ගිහ බිල්පත් වටිනාකම් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය සතු</u>	ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම තුළින් මේ සඳහා විසඳුම් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වෙනම අංශයක් (Procurement Division) ස්ථාපනය කළ බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. ඖෂධ ප්‍රසම්පාදන කටයුතු සඳහා ගතවන කාල සීමාව අවම කර ගැනීම සඳහා ප්‍රසම්පාදන කොමිෂන් සභාව	ප්‍රසම්පාදන ක්‍රියාවලින් සඳහා දීර්ඝ කාලයක් ගතවීම සම්බන්ධයෙන් ඉහත 08 හි පරිදි කටයුතු කරනු ලැබේ. ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) අනුග්‍රහය යටතේ ඖෂධ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන නව මාර්ගොපදේශ සංග්‍රහයක් සකස් කිරීම සම්බන්ධයෙන් උපදේශකවරයෙකු පත්කරනු ලැබ අතර, ඒ අනුව කෙටුම්පත් කරන ලද නව මාර්ගෝපදේශය නිරීක්ෂණ හා නිර්දේශ සඳහා ඉදිරිපත් කර

	<u>දන්න වල පරස්පරතාවයන් පැවතීම</u> (ප්‍රසම්පාදන ක්‍රියාවලිවන් සඳහා දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය)	විසින් නව මාර්ගෝපදේශ සකස් කරමින් තිබෙන බව හෙතම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.	ඇත . ඒ අනුව මෙම කෙටුම්පත් මාර්ගෝපදේශ සංග්‍රහය සමාලෝචනය කොට (Review) අමාත්‍යාංශයේ නිර්දේශ හා නිරීෂණය සහිතව ඉදිරි කටයුතු සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. තවද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරමින් පවති.
10	සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2024 වසරට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම	සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා 2024 වර්ෂයේ දී වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්ම මේ වනතුරු මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර නොමැති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. <u>නිරීක්ෂණ / නිර්දේශ</u> අයවැය ප්‍රතිපාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්ම අදාළ කාල රාමුව තුළදී ලබාදීම සිදුකල යුතු බවට නෛතික අවශ්‍යතාවයක් තිබෙන බැවින් 2024 වසරට අදාළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන සැලැස්ම කඩිනමින් පිළියෙල කර මසක කාලයක් තුළ එම සැලැස්මෙහි පිටපතක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.	2024 වර්ෂය සඳහා සකස් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන සැලැස්මේ මෘදු පිටපත ජාතික විගණන කාර්යාලය හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත 2024.05.09 දිනැතිව ඉදිරිපත් කර ඇත.
11	රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව විසින් සිදු කරන සැපයුම් ප්‍රමාදයන් පාලනය කිරීමට ඔවුන් වෙත ගෙවනු ලබන 10%ක සේවා ගාස්තුවෙන් අධිභාරයක් අයකර ගැනීම	තම සංස්ථාවේ නිලධාරීන්ගේ පාලනයෙන් තොරව සිදුවන ප්‍රමාදයන් සඳහා මෙම අයකිරීමෙන් නිදහස් කරන ලෙස රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ සභාපතිවරයා කාරක සභාවෙන් ඉල්ලා සිටියේය. එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා සිදුකරන සැපයුම් වෙනුවෙන් නිසි කලට මුදල් නොලැබීම හේතුවෙන් රු. බිලියන විස්සක බැංකු අයිරාවක් තම සංස්ථාව	2008-2023 කාලසීමාව අදාළව වෛද්‍ය සැපයීම් අංශය සඳහා සිදු කරන ලද සැපයුම් වෙනුවෙන් රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවට තවදුරටත් අයවිය යුතු හිඟ ශේෂ හඳුනා ගැනීම සඳහා වෛද්‍ය සැපයුම් අංශය හා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථා අතර සිදු කරන අතර, එහි පළමු අදියර යටතේ 2018-2023 කාලසීමාවට අදාළව සැසඳුම් ක්‍රියාවලිය 2025 වර්ෂය අගභාගයේදී අවසන් කළ අතර, එහිදී එකඟවූ

		ලබාගෙන තිබෙන බවත් අදාළ බැංකු අයිරාවේ පොළිය රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව මඟින් ගෙවන බවත් හෙතම තවදුරටත් ප්‍රකාශ කළේය. රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ 2008 වසරේ සිට නොගෙවා එකතු වූ රු. බිලියන 34 ක පමණ මුදලක් ගෙවීම සඳහා දැනට කමිටුවක් පත්කර ගනුදෙනු හඳුනාගැනීම් සිදුකරමින් පවතින බවත්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් මෙගිදි සඳහන් වූ අතර රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව විසින් 2024 මාර්තු මස ආරම්භය වනතෙක් වර්තමාන සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සිදුකර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ විය.	වටිනාකම වන රු බිලියන 23.87 ක් කැබිනට් අනුමැතියෙන් පසුව 2026 වර්ෂය තුළ දී වාරික වශයෙන් මේ වන විට සම්පූර්ණ වටිනාකම රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව වෙත ලැබී ඇත. මේ අනුව රු. බිලියන 20 ක් වූ බැංකු අයිරාව මේ වනවිට ගොඩා අවසන් කර ඇත. තවද එම ශේෂ සංසන්දන ක්‍රියාවලියේ දෙවන අදියර වන 2008-2017 කාලසීමාවට අදාළව හිඟ ශේෂ සැසඳුම් ක්‍රියාවලිය, මේ වනවිට වෛද්‍ය සැපයුම් අංශය හා රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාවේ සහභාගිත්වයෙන් ආරම්භ කර සිදුකරමින් පවතින අතර, එය කඩිනමින් නිම කිරීමට සැලසුම් කර ඇත. එමෙන්ම 2026 අප්‍රේල් 20 වන දින දක්වා සුදුසුකම් සම්පූර්ණ වූ සියලුම ගෙවීම් සඳහා සැපයුම්කරුවන් වෙත මේ වන විට ගෙවීම් කටයුතු සිදු කර ඇත. තවද රාජ්‍ය ඖෂධ නිතිගත සංස්ථාව හා වෛද්‍ය සැපයුම් අංශය අතර ශේෂයන් සැසඳීමේ කටයුතු 2018-2023 කාල සීමාව සඳහා අවසන් කර ඇති අතර, 2008-2017 කාල සීමාව සඳහා ශේෂයන් සැසඳීමේ කටයුතු මේ වනවිට සිදු කරනු ලැබේ.
12	<u>2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 109 වගන්තියේ ප්‍රධාන කරුණුවලට පරිභාහිර කරුණු සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම අත්හිටුවීම</u>	මෙගිදි ඖෂධ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේ ක්‍රමවේදය සඳහා අනුක්‍රමික අංකයක් ගඳුන්වා දීම, ආරක්ෂිත මුද්‍රාවක් භාවිත කිරීම, අදාළ සහතිකය ඉල්ලුම්කරුට/ ආනයනකරුට සෘජුව ලබා දීම වහාම නතර කර එහි වගකීම ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාට පැවරීම හා ඖෂධ නිදහස් කිරීමට පෙර එම සහතිකයේ නිවැරදිතාවය ජාතික	

		ඖෂධ නියාමන අධිකාරියේ වෙබ් අඩවිය මඟින් තහවුරු කර ගන්නා ලෙස ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාට උපදෙස් දීම වැනි ක්‍රමවේද හඳුන්වාදීම, අත්‍යාවශ්‍ය අවස්ථා වලදී එම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම වගකීමක් සහිත කමිටුවක අනුමැතිය මත සිදු කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග කඩිනමින් අනුගමනය කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කළ විගණකාධිපතිවරයා මේ සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය මෙතෙක් ගෙන ඇති පියවරයන් පිළිබඳව තම ප්‍රශංසාව පළ කළේය.	
13	නව ඖෂධයක් ලියාපදිංචි කිරීම සඳහා ඖෂධ නියාමන අධිකාරිය සඳහා ලබා දී ඇති දින 300ක කාල සීමාව නැවත සමාලෝචනය කර කෙටි කාලයකින් ඖෂධයක් ලියාපදිංචි කිරීමේ හැකියාව සොයා බැලීම හා එකම ඖෂධය වෙළඳ නාම රාශියකින් ලියාපදිංචි කිරීම සීමා කළ යුතු බව	මේ වන විට ලියාපදිංචි කිරීම අළුත් කිරීමට නොහැකි වූ ඖෂධ සඳහා අදාළ ලියාපදිංචි කාල සීමාව තාවකාලිකව දිර්ඝ කිරීමට හා මීට අදාළ ලියාපදිංචි කිරීමේ කටයුතු හා නව ඖෂධ ලියාපදිංචි කිරීම් කඩිනමින් සිදු කිරීමටත් කටයුතු කරමින් සිටින බවත් අධිකාරියට අවශ්‍ය නව කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සිදු කිරීමෙන් අනතුරුව ඖෂධ ලියාපදිංචි කිරීමේ කාල සීමාව තවදුරටත් අඩු කිරීම සඳහා කටයුතු කළ හැකි බවත් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිවරයා ප්‍රකාශ කළේය. එසේම නව ඖෂධය ලියාපදිංචි කිරීමේ කටයුතු ද මීට සමගාමීව සිදුකරනු ලබන අතර වෙළඳ නාම 05ට වඩා අඩුවෙන් පවතින ඖෂධ සඳහා ප්‍රමුඛතාවය හිමිවන බව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සභාපතිවරයා ප්‍රකාශ කළේය.	(i). එකම ඖෂධ වෙළෙඳ නාම කිහිපයකින් ලියාපදිංචි කිරීම සීමා කළ යුතු බව මෙය වෙළෙඳ නාම 15 ට දැනට සීමා කිරීමට කටයුතු කර ඇත. (ii). කෙටි කාලයකින් ඖෂධයක් ලියාපදිංචි කිරීමේ හැකියාව ඖෂධ නියාමන අධිකාරීන් පිළිගන්නා ආකාරයට නව ලියාපදිංචියක් සඳහා ලබා දෙන ඉල්ලීමක් අදාළ ඇගයීමෙන් පසු අඩු වශයෙන් වැඩ කරන දින 300 ක් ගත වීමට පෙර ලියාපදිංචිය ලබා දිය යුතු ය. දැනට ලබා ගන්නා නව ඉල්ලුම්පතක් සඳහා ඇගයීම ආරම්භ කිරීම වැඩ කරන දින 300 වඩා අඩු කාලයක් තුළ සිදු කිරීමට හැකියාව ලැබී ඇත. මෙය දේශීය නිෂ්පාදන සඳහා මේ වන විට දින 292ක් වන අතර ආනයනික නිෂ්පාදන සඳහා දින 272ක් වේ. කෙසේ වුව ද අත්‍යාවශ්‍ය ඖෂධ අඩු කාලයක් තුළ ලියාපදිංචි කිරීම සඳහා

			දැනට විවිධ ක්‍රියාමාර්ග භාවිතා වේ. එම ක්‍රියාමාර්ග කිහිපයක් පහත සඳහන් වේ. (අ) යම් ඖෂධයක් සඳහා ලියාපදිංචි වූ සැපයුම්කරුවන් 05 ට වඩා අඩුවෙන් ඇති අවස්ථාවක දී එවැනි ඖෂධ සඳහා කෙරෙන ඉල්ලුම්පත්‍ර ඇගයීමේ දී ප්‍රමුඛතාවය ලබා දීම. (ආ) ඇගයීමේ දී යොදා ගන්නා ලිපිලේඛන සංඛ්‍යාව ඇගයීමට හානියක් නොවන සේ අඩු කිරීම. (ඇ) ජාතික ඖෂධ නියාමන අධිකාරිය මඟින් හඳුනාගත් වෙනත් රටවල ඖෂධ නියාමන අධිකාරී මඟින් ලියාපදිංචි කර ඇති ඖෂධ ලියාපදිංචි කිරීමේ දී අදාළ ක්‍රමවේදය කෙටි කිරීම.(Reliance pathway) පසුගිය වසර 1 ½ තුළ ගත් විවිධ ක්‍රියාමාර්ග නිසා ඖෂධ ලියාපදිංචි කිරීම් සඳහා ලැබෙන ඉල්ලුම්පත්‍ර ඇගයීමේ විශාල ප්‍රමාදය සැලකිය යුතු ප්‍රමාණයකින් මහ හරවා ගැනීමට හැකියාව ලැබී ඇත. ඒ අනුව පසුගිය වර්ෂය තුළ දේශීය නිෂ්පාදන 224 අලුතින් ලියාපදිංචි කිරීමට හැකියාව ඇත. ඒ අතර රජයේ රෝහල්වලට අත්‍යාවශ්‍ය ඖෂධ සඳහා සමහර අවස්ථාවල දී දින 180 කට වඩා අඩු කාලයක් තුළ පවා ලියාපදිංචිය ලබා දී ඇත. එසේ වුවත් සියලු ඖෂධ සඳහා දින 300 ට වඩා අඩු කාලයක් තුළ ලියාපදිංචිය ලබා දීමේ තත්ත්වයට ළඟා වීමට තාමත් නොහැකි වී ඇත. මෙයට හේතු කිහිපයක් බලපා තිබේ. 1. ආරම්භයේ දී තිබූ ප්‍රමාදයට භාජනය වූ විශාල ඉල්ලුම්පත් ප්‍රමාණය 2. ආයතනයේ කාර්යය මණ්ඩලය රඳවා ගැනීමේ අපහසුතාවය (2025 වර්ෂයේ දී සේවක මණ්ඩලයෙන් 12 ක් ඉවත් වී ඇති අතර 2024

			වර්ෂයේ දී 11 දෙනෙකු ඉවත් වී ඇත. මේ වර්ෂයේ දී මේ වන විට 06 දෙනෙකු ඉවත් වී ඇත.) 3. පුරප්පාඩුවක් ඇති වූ විට එම පුරප්පාඩුව පිරවීම සඳහා පිළිගත නොහැකි ආකාරයේ දීර්ඝ කාලයක් ගත වීම. 4. නව කාර්යභාර්යන් සේවක මණ්ඩලය වෙත පැවරීමට සිදු වීම නිසා (උදාහරණ ලෙස Asycuda සහ Starlink) ඇගයීම් කටයුතු ඇතුලු අනෙකුත් කාර්යයන් යම් ප්‍රමාණයකින් අඩු වීම. 5. ඖෂධ ඇගයීම් සිදු කරන නිලධාරීන් අයත්වන වැටුප් කාණ්ඩ වන MM සහ JM කාණ්ඩ සඳහා සේවා මුරයට අමතරව වැඩ කරන පැය ගණන සඳහා මින් ඉහත දී අධ්‍යක්ෂක මණ්ඩලයෙන් අනුමැතියෙන් දිමනාවක් ගෙවුව ද ඒ පිළිබඳ විගණන විමසුමක් සිදු වූ බැවින් එය ගෙවීම නැවැත්වීමට සිදු වී ඇත. මේ නිසා සවස 4.30න් පසු හා සෙනසුරාදා හා ඉරිදා දිනවල කාර්යමණ්ඩලයේ සේවය සඳහා එම කාර්යමණ්ඩලය ලබා ගත නොහැකි වී ඇත. මෙසේ ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට මෙතෙක් සතුටුදායක ප්‍රතිචාරයක් ලැබී නැත. 6. කාර්යමණ්ඩලයේ සාමාජිකයින් ආයතනය හැර යාමට එක් හේතුවක් වී ඇත්තේ අප ආයතනයට සමාන්තර ආයතනවල ශුද්ධ වැටුප අප ආයතනයේ සේවකයන්ට ලැබෙන වැටුපට වඩා වැඩි වීමයි. මෙම තත්ත්වය වෙනස් කිරීම සඳහා මෙන්ම සේවකයන් තම කාර්යේ දී ගත්නා අවදානම ගැනද සලකා

			අවදානම් දීමනාවක් ඉල්ලුම් කළ ද ඒ සඳහා ද මෙතෙක් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. 7. ආයතනය තුළ සේවකයින් රඳවා ගැනීම සඳහා ඖෂධ ඇගයීමේ නිලධාරීන්ට අභ්‍යන්තර උසස් වීමේ ක්‍රමවේදයක් යෝජනා කළ ද එම යෝජනාව හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප වී ඇත.
14	<u>වෛද්‍ය සැපයුම් වට්ටෝරු සමාලෝචන කමිටුව නියමිත කාලයට රැස්කළ යුතු අතර එහි නිර්දේශයකින් තොරව කිසිදු වෛද්‍ය සැපයුමක් මිළදී නොගත යුතු බව හා , අදාළ කමිටු වාර්තාව වසර අවසානයේදී නිකුත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සකස් කිරීම කළ යුතු බව</u>	2022 වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පත් කර ඇති “ වෛද්‍ය සැපයුම් වට්ටෝරු සමාලෝචන කමිටුව” ඖෂධ සම්බන්ධයෙන් වසර 02ට වරක් හා ශල්‍ය ද්‍රව්‍ය හා රසායනාගාර අයිතම සම්බන්ධයෙන් වසර 03ට වරක් රැස්වී සමාලෝචනයන් සිදු කරනු ලබන බවත්, රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව පත්කළ සියලුම අංශවල වෛද්‍ය විශේෂඥයන්ගෙන් සැදුම් ලත් කමිටුවක් මගින් මිලට ගන්නා ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය වර්ග ප්‍රමාණයන් සීමා කළ බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. මෙහි දී අදාළ සමාලෝචනයන් සිදු කිරීමේ කාලසීමාව නවදුරටත් අඩුකිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ද කාරක සභාව විසින් විමසන ලදි. ප්‍රායෝගික හේතූන් නිසා මෙම සමාලෝචන කාල සීමාව අඩු කිරීමට හැකියාවක් නොමැති බව ප්‍ර.ග.නි. කාරක සභාවට දන්වා සිටියේය.	<u>වට්ටෝරු සමාලෝචන කමිටුව සඳහා අධිකාරී බලය ලබා දීම</u> වට්ටෝරු සමාලෝචනය දැනට පාලනය වන්නේ ඖෂධ ප්‍රසම්පාදනය සඳහා වන කැබිනට් තීරණය සහ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්ම (2012.12.05 දිනැති කැබිනට් පත්‍රිකා අංක 12/1602/509/005-II) මගින් වේ. <u>වට්ටෝරු සමාලෝචනය</u> ඖෂධ, ශල්‍ය වෛද්‍ය අයිතම සහ රසායනාගාර අයිතම සඳහා වට්ටෝරු සමාලෝචන කටයුතු කාලානුරූපව පහත සඳහන් කාලරාමුවලට අනුකූලව පවත්වනු ලැබේ: <u>ඖෂධ අයිතම</u> පෙර වට්ටෝරු සමාලෝචන කමිටුවෙහි (FRC) අවසාන ලැයිස්තුව අනුමත කළ දින සිට වසර දෙකක් (02) සම්පූර්ණ කිරීමෙන් පසු වට්ටෝරු සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය. <u>ශල්‍ය අයිතම</u> පෙර වට්ටෝරු සමාලෝචන කමිටුවෙහි (FRC) අවසාන ලැයිස්තුව අනුමත කළ දින සිට වසර තුනක් (03) සම්පූර්ණ කිරීමෙන් පසු වට්ටෝරු සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය.

			<u>රසායනාගාර අයිතම</u> පෙර FRC හි අවසාන ලැයිස්තුව අනුමත කළ දින සිට වසර තුනක් (03) සම්පූර්ණ කිරීමෙන් පසු වට්ටෝරු සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය. <u>විශේෂ/හදිසි අවස්ථා</u> ඉහත කාලරාමු නොතකා, වට්ටෝරු සමාලෝචන කමිටුවෙහි අනුමැතිය හෝ මඟ පෙන්වීම අවශ්‍ය වන හදිසි හෝ විශේෂ අවශ්‍යතාවයක් ඇති වුවහොත්, වෛද්‍ය සැපයුම් අංශය (MSD) වහාම FRC සමඟ සන්නිවේදනය කර එවැනි තත්වයන් ඵලදායී ලෙස විසඳීම සඳහා අවශ්‍ය තීරණ සහ අනුමැතීන් එක් එක් අවස්ථාව අනුව ලබා ගනී. <u>අනුමැතිය සහ ප්‍රකාශනය</u> අවසාන වට්ටෝරු සමාලෝචන ලැයිස්තුව සඳහා අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබයි. අනුමැතිය ලබා ගැනීමෙන් පසු, අවසන් කරන ලද වට්ටෝරු සමාලෝචන ලැයිස්තු ආයතනික ඇස්තමේන්තු සැකසීම හා ඒ සම්බන්ධ කටයුතු සඳහා MSMIS පද්ධතිය හරහා නිල වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබේ. <u>වට්ටෝරු සමාලෝචන කමිටුව අනුමත අයිතම සඳහා වාර්ෂික ඇණවුම් කිරීම</u> වට්ටෝරු සමාලෝචන කමිටුව අනුමත අයිතම සඳහා ආයතනික ඇස්තමේන්තු ඒකාබද්ධ කිරීම අවසන් වූ පසු, වෛද්‍ය සැපයුම් අංශය (MSD) පුරෝකථනය සිදු කළ යුතු අතර අනුමත වට්ටෝරු සමාලෝචන ලැයිස්තුවට ඇතුළත් අයිතම සඳහා පමණක් වාර්ෂික ඇණවුම් කිරීම සඳහා ඇණවුම් සකස් කළ යුතුය.

15	වෛද්‍ය සැපයුම් ක්‍රියාවලිය කළමනාකරණ සඳහා තොග කළමණාකරනය පිළිබඳව වෘත්තීමය සුදුසුකම් ඇති අයගේ සේවාව ලබා ගැනීමට කටයුතු සිදුවීම හා මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නිලධාරීන්ට තොග කළමණාකරනය පිළිබඳව නියි පුහුණුවක් හා යාවත්කාලීන දැනුමක් ලබා දීමට ක්‍රමවේදයක් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සැකසීම	තොග කළමනාකරණය පිළිබඳ වෘත්තීය දැනුමක් තිබෙන අයගේ සේවාව ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර තොග පාලන වෛද්‍ය සැපයුම් හා අංශවලට අනුයුක්ත නිලධාරීන්ට හා ඖෂධවේදීන් සඳහා 2024 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා තොග පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කර ඇති බවත් වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරීන්ගේ සහය ලබාගෙන අදාළ නිලධාරීන්ට විසිමත් පුහුණුවක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.	මානව සම්පත් ධාරිතාව සහ වෘත්තීය සංවර්ධනය - වෛද්‍ය සැපයුම් අංශය (MSD) ශ්‍රී ලංකාවේ වෛද්‍ය සැපයුම් අංශයේ (MSD) වෛද්‍ය සැපයුම් කළමනාකරණ ක්‍රියාවලීන් ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ ඖෂධවේදීන්, වෛද්‍ය රසායනාගාර කාර්මිකයන්, විකිරණ ශිල්පීන් සහ වෛද්‍ය සැපයුම් සහකාරවරුන් විසිනි. කාර්ය මණ්ඩල කාණ්ඩ දෙකම විද්‍යා පසුබිමකින් බඳවා ගනු ලැබේ. සාමාන්‍යයෙන් ගණිතය හෝ විද්‍යා විෂය ධාරාවන්හි උසස් පෙළ සුදුසුකම් ඇත. නමුත් වෛද්‍ය සැපයුම් අංශයේ (MSD) සැපයුම් දාම කළමනාකරණය සහ තොග පාලනය වෛද්‍ය සැපයුම්වල විශේෂිත ස්වභාවය නිසා සාමාන්‍ය සැපයුම් දාම කළමනාකරණයට වඩා වෙනස් වේ. එබැවින්, සැපයුම් දාම මෙහෙයුම් සහ තොග පාලනයට අදාළ තීරණ තාක්ෂණිකව නිවැරදි බවත්, ගුණාත්මකභාවය සහ ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල බවත් සහතික කිරීම සඳහා ඖෂධවේදීන්, වෛද්‍ය රසායනාගාර කාර්මිකයන් සහ විකිරණ ශිල්පීන්ගේ තාක්ෂණික විශේෂඥතාව ඒකාබද්ධ කර ඇත. ඖෂධවේදීන් සාමාන්‍යයෙන් ඖෂධවේදී ඩිප්ලෝමාව හෝ ඖෂධවේදී උපාධිය (B.Pharm) උපාධි ලබා ඇති අතර බොහෝ දෙනෙකුට සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා හෝ උපාධි වැනි වැඩිදුර සුදුසුකම් ඇත. ඒ හා සමානව, වෛද්‍ය සැපයුම් සහකාරවරුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ගබඩා සහ ඉන්වෙන්ටරි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව දරන අතර, සියල්ලන්ටම සැපයුම් දාම කළමනාකරණය, ඉන්වෙන්ටරි කළමනාකරණය සහ ගබඩා කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල ඩිප්ලෝමා සහ සහතික

			මට්ටමේ පුහුණු වැඩසටහන් සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දී ඇත. මෙම ප්‍රධාන කාණ්ඩවලට අමතරව, MSD ක්‍රියාවලීන්හි නියැලී සිටින අනෙකුත් සහායක කාර්ය මණ්ඩලයට සැපයුම් දාම කළමනාකරණය සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ මූලික දැනුම සහ පුහුණුව ද ලබා දෙනු ලැබේ. තවද, MSD සේවාස්ථ අධ්‍යාපන අවස්ථා සහ යාවත්කාලීන පුහුණු වැඩසටහන් (දේශීය සහ විදේශීය) ලබා දීමෙන් අඛණ්ඩ වෘත්තිය සංවර්ධනයට පහසුකම් සපයයි. මෙම මූලපිරීම් විශේෂයෙන් ඖෂධවේදීන් සහ වෛද්‍ය සැපයුම් සහකාරවරුන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම සහ වෛද්‍ය සැපයුම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම් සහතික කෙරේ.
16	ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පරීක්ෂණාගාර පහසුකම් පුළුල් කිරීම හා අවශය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සතු ගොඩනැගිලි කිහිපයක් ජාතික ඖෂධ නියාමන අධිකාරියට ලබා දීම සඳහා දැනට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇතිබව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එමඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය සතු ගොඩනැගිලි ද භාවිත කරමින් අධිකාරිය සතු පරීක්ෂණාගාරය පුළුල් කිරීමට අවස්ථාව සැලසෙන බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය. මෙම කාර්ය සඳහා අවශ්‍ය උපදේශන කටයුතු සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO)කණ්ඩායමක් අප්‍රේල් මස 28 දින ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළ අතර මිනුම් ඒකක	මේ පිළිබඳ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. 1. රසායනාගාරය පුලුල් කිරීම සඳහා දැනට රසායනාගාරය පිහිටි ගොඩනැගිල්ලට අමතරව එම පරිශ්‍රයේම පිහිටි අනෙකුත් ගොඩනැගිල්ල ද (පෙර නියාමන අංශයේ කාර්ය මණ්ඩලය සිටි) යොදා ගැනීමට කටයුතු කර ඇත. 2. රසායනාගර ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇත. එහි වගල ප්‍රතිසංස්කරණය නිම කර ඇති අතර ඉතිරිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමට හා ඇස්තමේන්තු ලබා දීමට පුද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. මෙය ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මගින් සිදු

		ගොඩනැගිල්ල පරීක්ෂාකර බැලීමෙන් අනතුරුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ නිලධාරීන් එය පරීක්ෂණාගාරය පිහිටුවීම සඳහා නුසුදුසු බව ප්‍රකාශ කළ බව කාරක සභාවට දන්වා සිටියේය.	කරන අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉංජිනේරු අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. 3. ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත රසායනාගරයේ කාර්යය මණ්ඩලය පුහුණු කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර එය දැනට සිදු වෙමින් පවති. 4. ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත පත් කළ උපදේශකවරයෙකු විසින් slab accreditations සඳහා කළ යුතු වෙනස්කම් පිළිබඳ ඇගයීමක් දැනට සිදු කරමින් සිටී. 5. පරීක්ෂණ කටයුතු තව දුරටත් පුලුල් කිරීම සඳහා නව තාක්ෂණික උපකරණ හා රසායනික ද්‍රව්‍ය (Reference Stands) මිල දී ගැනීමට කටයුතු කරමින් පවති. මේ සඳහා මිලියන 77 ක මුදලක් වෙන් කර ඇත.
17	<u>සෑම මසකම පළමු සතිය තුළ ඖෂධ හා චිකිත්සක කමිටු (Drug and Therapeutics Committee) පැවැත්වීම</u> ඖෂධවල පවතින ප්‍රමාණයන්, ඖෂධ හිඟවීම හා අතිරික්තයන් හා ඖෂධ භාවිතයෙන් ඇතිවන සංකූලතා ආදිය පිළිබඳව මාසිකව වාර්තා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දෙන ලෙස උපදෙස් ලබා දී ඇති	ප්‍රධාන රෝහල්වල මෙම රැස්වීම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නිලධාරියෙකු සහභාගී වන බවත් මාස 2කට වරක් පවත්වනු ලබන අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේ දී මෙම වාර්තාව ලබා දුන් හා නොදුන් නාමලේඛනයක් ප්‍රදර්ශනය කරනු ලබන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් ප්‍රකාශ කළහ. <u>නිරීක්ෂණ/ නිර්දේශ</u> මෙහිදී රෝහලේ හිඟ ඖෂධ, දන්න පද්ධතීන් භාවිත කිරීම තුළින් හඳුනාගැනීමටත් ඉදිරි ඖෂධ අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනාගැනීම මඟින් කල් ඇතිව ඖෂධ ඇණවුම් කිරීමට කටයුතු කිරීම හරහා	<u>ඖෂධ සහ චිකිත්සක කමිටු (DTC) රැස්වීම් සහ වාර්තාකරණය</u> ඖෂධ සහ චිකිත්සක කමිටු (DTC) රැස්වීම් ඖෂධ කළමනාකරණය පිළිබඳ අත්පොතට අනුකූලව පැවැත්විය යුතුය. වෛද්‍ය සැපයුම් අංශය (MSD) විසින් අදාළ ආයතන වෙත වක්‍රලේඛ නිකුත් කරනු ලබන අතර, අවශ්‍ය පරිදි DTC රැස්වීම් පවත්වන ලෙස ඔවුන්ට මතක් කර දෙනු ලැබේ. ඖෂධ සහ චිකිත්සක කමිටු (ඖෂධ සමාලෝචන කමිටු ලෙසද හැඳින්වේ) වෛද්‍ය සැපයුම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම අධීක්ෂණය කිරීම සඳහා ඵලදායී සංසදයක් ලෙස සේවය කරයි. මෙම කමිටු ඖෂධ කළමනාකරණයට සම්බන්ධ වී සිටින සෞඛ්‍ය සේවා

	නමුත් ආයතන 380ක් අතරින් ආයතන 139ක් පමණක් එම වාර්තා එවා ඇති බව කාරක සභාව හමුවේ අනාවරණය විය.	රෝහල් මගින් සිදුකරනු ලබන දේශීය මිලදී ගැනීම් අඩම කළයුතු බවත් කාරක සභාව අවධාරණය කළේය.	ආයතනවල විවිධ විශේෂතා, ඒකකවල නියෝජිතයින් අතර එකඟතාව මත පදනම් වූ තීරණ ගැනීම පහසු කරයි. ඒ අනුව, ඖෂධ සහ චිකිත්සක කමිටු පහත සඳහන් මට්ටම්වල ස්ථාපිත කර නිතිපතා ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ: • ජාතික මට්ටම • පළාත් මට්ටම • කලාපීය මට්ටම • ආයතනික මට්ටම සෑම DTC රැස්වීමකින් පසුවම, වෛද්‍ය සැපයුම් අංශය (MSD) අදාළ ආයතනවලින් රැස්වීම් මිනිත්තු/වාර්තා ලබා ගත යුතුය. මෙම වාර්තා සම්පාදනය කර ද්විවාර්ෂික පදනමින් (සෑම මාස හයකට වරක්) රැස්වන ජාතික ඖෂධ සහ චිකිත්සක කමිටුව (NDTC) වෙත ඉදිරිපත් කළ යුතුය.
18	<u>සමීක්ෂණයක් සිදුකර රෝහල්වල හිඟ, අතිරික්ත හා ඌන උපයෝජිත වෛද්‍ය උපකරණ පිළිබඳව පරිගණක දත්ත පද්ධතියක් සකසා අවශ්‍යතාවය අනුව වෛද්‍ය උපකරණ රෝහල් අතර මාරු කිරීම හා ප්‍රමුඛතා පදනම් (Priority List) මත වෛද්‍ය උපකරණ සම්පාදනයන් සිදු කිරීම සහ ජීව වෛද්‍ය</u>	දැනට යම් මට්ටමකින් වෛද්‍ය උපකරණ පිළිබඳව ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතියක් පවත්වාගෙන යන බවත් රෝහල් තුළ තිබෙන ප්‍රධාන වෛද්‍ය උපකරණ පිළිබඳ දත්තයන් සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව පවතින බවත් සෙසු ප්‍රධාන උපකරණ 25000ක පමණ දත්ත පද්ධතිය සකසමින් පවතින බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. එමෙන්ම මෙම යෝජිත කාර්යයන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රතිපාදන හිඟකම් සම්බන්ධයෙන් කාරක සභාව දැනුවත් කළ හෙතෙම් මේ හේතුවෙන් අමාත්‍යාංශය විසින් පත්කළ කමිටුවකට ඉදිරිපත් කර ප්‍රමුඛතා	KOFIH ව්‍යාපෘතියේ ආධාර මත පරිගණක දත්ත පද්ධතියක් සැකසීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර ඒ සඳහා උපදේශන සේවාව සැපයීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය තෝරා ගන්නා ලදි. එම උපදේශනය යටතේ ලංසු ලියකියවිලි සකසා ඇති අතර ප්‍රසම්පාදනය, ලංසු කැඳවීමේ අවස්ථාවේ පවතී. මෙම ව්‍යාපෘතිය යටතේම රජයේ රෝහල්වල සියලුම වෛද්‍ය උපකරණ පිළිබඳව තොරතුරු පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කරන අතර එමඟින් ඌන උපයෝජිත වෛද්‍ය උපකරණ හඳුනාගැනීමට හැකිවන අතර ඒ අනුව එම

	ඉංජිනේරු අංශය මගින් අදාළ වාර්තා පවත්වා ගැනීම	අනුපිළිවෙලකට අනුව වැඩකටයුතු සිදු කරමින් පවතින බව වැඩිදුරටත් ප්‍රකාශ කළේය. එමෙන්ම ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ ඉංජිනේරු සහ තාක්ෂණික ශිල්පීන් සිමා සහිත වීම හේතුවෙන් මෙම කාර්යයන් කඩිනමින් සිදු කිරීම දුෂ්කර බව මෙහිදී අමාත්‍යාංශ නිලධාරිහු පෙන්වා දුන් අතර පසුගිය වර්ෂයන්හි වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබුණු බවත් ඒ සඳහා රු. බිලියන 60ක පමණ මුදලක් අවශ්‍ය වන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.	උපකරණ අවශ්‍යතාවය මත රෝහල් අතර මාරු කිරීම ද සිදු කළ හැක. රෝහල්වලට අවශ්‍ය වෛද්‍ය උපකරණ ඉල්ලුම් කිරීමද මාර්ග ගත ක්‍රමය අනුව පරිගණක දත්ත පද්ධතිය හරහාම සිදු කළ හැකි අතර ප්‍රමුඛතා පදනම මත ප්‍රසම්පාදන කටයුතු සිදු කළ හැක.
19	රටතුළ තිබෙන රෝහල් වර්ගීකරණයක් සිදුකර අදාළ රෝහල් වර්ගය අනුව අවශ්‍ය වෛද්‍ය උපකරණ සඳහා පොදු පිරිවිතරයන් ඇතුළත් චක්‍රලේඛයක් ජීව වෛද්‍ය ඉංජිනේරු /රසායනාගාර සේවා අංශය මගින් නිකුත් කිරීමට කටයුතු කිරීම හා මෙහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් 2023.12.31 දින වනවිට කාරක සභාව වෙත ලැබීමට සැලැස්විය යුතු බව	මේ සම්බන්ධයෙන් දැනට කටයුතු කරමින් පවතින බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. දැනට රට තුළ තිබෙන රෝහල්වල වර්ගීකරණයක් පවතින බැවින්, එම වර්ගීකරණයට අනුව අදාළ රෝහල්වල පැවතිය යුතු වෛද්‍ය උපකරණ සම්බන්ධයෙන් සැලැස්මක් විශේෂඥ වෛද්‍යවරුන් සමඟ සාකච්ඡා කර අමාත්‍යාංශය මගින් සකස් කරමින් පවතින බවත් ඒ අනුව මාස කිහිපයක් ඇතුළත මීට අවශ්‍ය චක්‍රලේඛයක් නිකුත් කිරීමට බලාපොරොත්තු වන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.	වෛද්‍ය උපකරණයන් සඳහා පොදු පිරිවිතරයන් සකස් කිරීමේ කටයුතු එක් එක් වෛද්‍ය උපකරණයන් සඳහා පත්කරන ලද විශේෂඥ කමිටු මගින් සිදු කරමින් පවති. එසේ පිළියෙල කරන ලද පිරිවිතර අනුමැතිය සඳහා යොමු කිරීමෙන් පසු ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ වෙබ් අඩවියට ඇතුළත් කිරීම සිදු කළ හැකි අතර ඒවා ප්‍රසම්පාදන කටයුතු සඳහා ද යොදා ගත හැක.
20	ඖෂධ විධිමත් ලෙස අවශ්‍ය උෂ්ණත්ව පරාසයන් තුළ ගබඩා නොකිරීම හේතුවෙන්	ඖෂධ ගබඩා කර තැබීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැති බැවින් ඖෂධ ගබඩා කිහිපයක් වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට ගෙන ඇති බවත් ප්‍රකාශ කළ සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් දැනට	ගබඩා කොන්දේසි වෛද්‍ය සැපයුම් අංශයේ (MSD) සියලුම ඖෂධ ගබඩා, ප්‍රමිතීන්ට අනුකූලව නියාමනය කරන ලද උෂ්ණත්ව තත්ත්වයන් යටතේ පවත්වාගෙන යනු ලැබේ. ඉතා නිශ්චිත

	ඒවායේ ගුණාත්මකබාවය පහත වැටීමක් සිදුවන බැවින් ඖෂධ ප්‍රමිතීන් පිළිබඳ විමර්ශන කටයුතුවලදී භාවිත කිරීම සඳහා, ඖෂධ මිලදී ගැනීමේ ටෙන්ඩර් සාම්පල් මෙන්ම ලබා ගන්නා නියදි සාම්පල් ඵ එම තොගය රෝහල් වෙත නිකුත් කර භාවිතයෙන් අවසන්වන තුරු නිසි ප්‍රමිතීන්ට අනුකූලව ගබඩා කර තැබීමට කටයුතු කිරීම	නියැදි සාම්පල ගබඩා කර තැබීම සිදු කරන නමුත් එම ඖෂධ ප්‍රශස්ත උෂ්ණත්වයේ ම තිබෙන බවට සහතික විය නොහැකි බවත් ඉදිරියේ දී නියැදි සාම්පල සඳහා ගබඩාවක් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කළය. තත්ත්වයෙන් අසමත් ඖෂධ තොග නියමිත උෂ්ණත්ව පරාස තුළ ගබඩා කර තැබීමක් සිදු නොවන බැවින් තත්ත්වයෙන් අසමත් ඖෂධ සඳහා අලාභ අයකර ගැනීම හා සම්බන්ධ නඩු කටයුතුවල දී එය අවාසිදායක අයුරින් බලපෑම කාරක සභාව විසින් පෙන්වා දෙන ලදි. ආහාර දෙපාර්තමේන්තුව සතුව දැනට පවතින වෙයන්ගොඩ ගබඩාව සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරාගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීහු ප්‍රකාශ කළහ.	සහ විශේෂ උෂ්ණත්ව අවශ්‍යතා සහිත ඖෂධ සඳහා, නිෂ්පාදකයාගේ සිට MSD ගබඩා දක්වා සැපයුම් දාමය පුරා උෂ්ණත්ව අධීක්ෂණය සහතික කෙරේ. <u>ගබඩා කොන්දේසි – අනාගත සංවර්ධනයන්</u> ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහ ලෝක බැංකුවේ (WB) අරමුදල් යටතේ, නව ගබඩා ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ගබඩා අවශ්‍ය උෂ්ණත්ව පාලන ප්‍රමිතීන් සහ ආර්ද්‍රතා පාලන අවශ්‍යතා සපුරාලීම මෙහි මූලික අරමුණයි. <u>නියැදි රඳවා තබා ගැනීම</u> සපයන ලද ඖෂධවල සාම්පල රඳවා තබා ගැනීම සඳහා සාම්පල රඳවා ගැනීමේ කාමරයක් ස්ථාපිත කර ඇති අතර එය දැනට ක්‍රියාත්මක වේ. තවද, වෛද්‍ය සැපයුම් අංශය (MSD) අනාගතයේදී සාම්පල රඳවා ගැනීමේ පහසුකමේ ක්‍රියාකාරිත්වය තවදුරටත් සංවර්ධනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට අදහස් කරයි. වෛද්‍ය සැපයුම් අංශය (MSD) එහි සැපයුම් යවිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලෝක බැංකුව (WB) හරහා උෂ්ණත්වය පාලනය කරන ලද ලොරි සැපයීමට ඉල්ලා ඇත. මෙම මුලපිරීම ඖෂධ දාම කළමනාකරණය වැඩිදියුණු කිරීම, උෂ්ණත්වයට සංවේදී වෛද්‍ය සැපයුම්වල ආරක්ෂිත සහ කාර්යක්ෂම ප්‍රවාහනය සහතික කිරීම සහ බෙදාහැරීමේ ක්‍රියාවලිය පුරා නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම අරමුණු කර ගෙන ඇත. තවද, එය වෛද්‍ය සැපයුම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම වැඩිදියුණු කිරීමට

			සහ සැපයුම් දාම මෙහෙයුම්වල සමස්ත කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වයට දායක වනු ඇත.
21	ප්‍රධාන වෛද්‍ය උපකරණවලට අදාළ නඩත්තු හා සේවා ගිවිසුම්, අත්‍යාවශ්‍ය සායන කටයුතු සඳහා භාවිත කරන වෛද්‍ය උපකරණ ක්‍රියාවිරහිත වීම සහ අලුත්වැඩියා කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය වන තොරතුරු ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය වෙත මාර්ගගත දත්ත පද්ධතිය මඟින් වාර්තා කිරීම	ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය විසින් සිදුකරනු ලබන නඩත්තු කිරීම 548ක පමණ Microsoft excel ලේඛනයක් ලෙස දැනට සකස් කර තිබෙන බව සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් ප්‍රකාශ කළහ. පසුගිය සමයේ තිබූ මුල්‍ය අර්බුදය හේතුවෙන් රෝහල් තුළ පැවති ප්‍රධාන වෛද්‍ය උපකරණ වලට ද සේවා ගිවිසුම් (Service Agreements) අත්සන් නොකළ බවත් මෙම වසරේ රු. බිලියන 4ක පමණ මුදල් ප්‍රතිපාදන ලැබීමත් සමඟ එම සේවා ගිවිසුම්යාවත්කාලීන කර ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.	ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ පරිගණක දත්ත පද්ධතිය සකස් කළ පසු සේවා හා නඩත්තු ගිවිසුම් මඟින් නඩත්තු කරන සියලුම වෛද්‍ය උපකරණවල ක්‍රියා විරහිතවීම සහ නඩත්තු කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ ජීව වෛද්‍ය සේවා අංශය වෙත වාර්තා කිරීම සඳහා පහසුකම් සැලසෙනු ඇත. මේ වනවිට දත්ත පද්ධතිය සැකසීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
22	<u>රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සියලුම ඇණවුම් වල ප්‍රගතිය සම්බන්ධයෙන් පිරිස්සුම් ලැයිස්තුවක් (Check List) සැකසීම සහ එය වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ හා නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ දිනපතා අධීක්ෂණයට ලක් කිරීම</u>	ස්වස්ථ පද්ධතිය ඔස්සේ මාර්ගගත ක්‍රමවේදයක් හරහා ඕනෑම අවස්ථාවක ඇණවුම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සිදුනළ හැකි බවත් සෑම සතියකටම වරක් සෞඛ්‍ය ලේකම් විසින් අදාළ නිලධාරීන් කැඳවා ප්‍රගතිය සම්බන්ධ පරීක්ෂාවක් සිදුකරනු ලබන බවත් ඊට අමතරව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ද සෑම සතියකටම වරක් පසු විපරමක් (re-view) සිදු කරනු ලබන බවත් සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීහු කාරක සභාව හමුවේ ප්‍රකාශ කළහ. මිය අමතරව ආයතන හා රෝහල් මඟින් පැමිණිලි ලැබෙන අවස්ථාවන්හි ස්වස්ථ පද්ධතිය ඔස්සේ අදාළ පරීක්ෂා කිරීම සිදුකරනු ලබන බවත් අමාත්‍යාංශ නිලධාරීහු වැඩිදුරටත් ප්‍රකාශ කළහ.	<u>ඇණවුම් අධීක්ෂණ සහ සමාලෝචන යාන්ත්‍රණය</u> MSD තොග පාලන නිලධාරීන් විසින් තිරණාත්මක අයිතම ලැයිස්තු නඩත්තු කිරීම් ඇතුළුව ඇණවුම්වල තත්ත්ව වාර්තා නඩත්තු කිරීම සහ නිතිපතා යාවත්කාලීන කිරීම සිදු කරයි. ඊට අමතරව, අබණ්ඩ සැපයුම් සහතික කිරීම් සඳහා වෛද්‍ය සැපයුම් අංශය (MSD) රාජ්‍ය ඖෂධ සංස්ථාව (SPC) සමඟ සහකාර අධ්‍යක්ෂවරුන් (සැපයුම්), තොග පාලන නිලධාරීන්ගේ ප්‍රධානියා සහ තොග පාලන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සතිපතා ඇණවුම් සමාලෝචන රැස්වීම් පවත්වයි. තවද, සතිපතා වෛද්‍ය සැපයුම් සමාලෝචන (MSR) රැස්වීම් MSD, SPC, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA), රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) සහ සෞඛ්‍ය අමාත්‍යාංශය (MOH) හි නියෝජිතයින්ගේ

			සහභාගිත්වයෙන් පවත්වනු ලබන අතර, නිරණාත්මකභාවය මත පදනම්ව සැපයුම් සම්බන්ධ සියලු කරුණු සමාලෝචනය කෙරේ. සාමාන්‍යයෙන්, SPC සමඟ එක් වසරක් තුළ කරන ලද මුළු ඇණවුම් සංඛ්‍යාව 6,500 ඉක්මවයි. පෙර වසරවල ඇණවුම් සමඟ එකතු වූ විට, ඕනෑම අවස්ථාවක SPC සමඟ ඇති මුළු ක්‍රියාකාරී ඇණවුම් සංඛ්‍යාව 15,000 ඉක්මවයි. එබැවින්, සැපයුම්වල නිරණාත්මක බව මත පදනම්ව ඇණවුම් ප්‍රමුඛතාකරණය කර සමාලෝචනය කරනු ලබන අතර, ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග යෝජනා කරනු ලැබේ.
23	<u>සියලුම හදිසි මිලදී ගැනීම් වලදී අදාළ ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දියයුතු අතර එහි ඖෂධය පිළිබඳව තොරතුරු රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඇණවුම්හි ප්‍රගතිය, තොග ලැබීමේ දිනාවකවානු, තොග සැපයීමේ ප්‍රමාදවීම් හා ප්‍රමාදයට වගකිවයුතු නිලධාරීන් කවුරුන්ද යන්න සඳහන් කිරීම</u>	හදිසි මිලදී ගැනීම් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දැනට සම්පූර්ණයෙන්ම නතර කර තිබෙන බවත්, ආයතන මට්ටමින් සිදුකරන මිල දී ගැනීම් සඳහා ආකෘති පත්‍රයක් පවතින බවත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. රෝහල් මට්ටමින් සිදුකරනු ලබන මිලදී ගැනීම් සඳහා ආකෘති පත්‍රයට මෙම කාරණා ද ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරක සභාව නිර්දේශ කළේය.	<u>හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය - අනුමැතිය සහ ලියකියවිලි.</u> අනපේක්ෂිත විවිධ හේතූන් මත පැන නගින සැපයුම් හිඟයන් සපුරාලීම සඳහා හදිසි ඇණවුම් නිකුත් කරනු ලබන්නේ සුවිශේෂී තත්වයන් යටතේ පමණි. කෙසේ වෙතත්, සැපයුම් දාම ගැටළුවක් හේතුවෙන් තොග අවසන් වන අවස්ථාවන්හිදී, MSD, වෛද්‍ය සැපයුම් සමාලෝචන කමිටුව සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සම්පූර්ණ පරීක්ෂාවකින් පසුව, රාජ්‍ය ඖෂධ සංස්ථාව (SPC) වෙත හදිසි ඇණවුම් (L-ඇණවුම්) ලබා දෙනු ලැබේ. වෛද්‍ය සැපයුම්වල යෝජිත සියලුම හදිසි අවස්ථා පළමුව වෛද්‍ය සැපයුම් සමාලෝචන (MSR) රැස්වීමේදී ඉදිරිපත් කර සාකච්ඡා කරනු ලැබේ. සවිස්තරාත්මක අයිතිමණය සහ පරීක්ෂාවෙන් පසුව, MSR අනුමැතිය ලබා ගනී. මෙම සාකච්ඡා අතරතුර, සැපයුම් පරතරය හෝ හිඟයට අදාළ සියලු අදාළ තොරතුරු ගොඩින් සමාලෝචනය කෙරේ.

			පසුව. අනුමත කරන ලද ඉල්ලීම් සවිස්තරාත්මක උපකාරක ලියකියවිලි සමඟ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ (DGHS) අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ. වර්තමානයේදී, හදිසි නියෝග (L-orders) සම්බන්ධ සියලුම වාර්තා අදාළ තොග පාලන නිලධාරීන් විසින් ක්‍රමානුකූලව නඩත්තු කරනු ලැබේ. <u>දේශීය මිලදී ගැනීම් අනුමත කිරීම්</u> තොග හිඟ අවස්ථාවන්හිදී සැපයුම් හිඩැස් පියවා ගැනීම සඳහා, රෝහල් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ප්‍රවේශමෙන් විශ්ලේෂණය කිරීමෙන් පසු වෛද්‍ය සැපයුම් අංශය (MSD) දේශීය මිලදී ගැනීම් සඳහා අනුමැතිය ලබා දෙයි. එවැනි අනුමැතියන් නිකුත් කරනු ලබන්නේ බාධාවකින් තොරව රෝගී සත්කාර සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීමේ අරමුණින් ය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස
ගරු සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.